# බුද්ධකාලීන භික්ෂු හැසිරීම් වෙනස් වීම පිළිබඳ විමර්ශනයක්

**පනාමුරේ චන්දිම හිමි**

සංඝ සමාජය මුල් විසි වස තුළ ක්‍රමානුකූලව හා විනය ගරුකව පැවතියේය. එයට ප්‍රධාන හේතු සාධකය වූයේ බුදු දහමෙහි ප්‍රධාන පරමාර්ථය වන "නිබ්බාන" යන්න අරමුණු කොට ගෙන ජීවිතය පිළිබඳ මනා අවබෝධයක් ලැබූ පිරිස් විශාල පිරිසක් සසුන්ගත වීමයි. ඔවුනට ජීවිතයෙහි යථාර්ථය සෙවීම මිසක අන්‍ය වූ කිසිඳු අරමුණක් නොවීය. ජීවිතය පිළිබඳ දීර්ඝ චින්තාවලියකින් පසුව සැබෑ නිදහස, සැබෑ සතුට කුමක් ද යන්න ඔවුන් ඉතා ඕනෑකමින් යුක්තව සොයා බැලූ අතර එකල කිසිඳු භික්ෂුවකගෙන් ශාසන විරෝධී ක්‍රියාවක් සිදු නොවුණි. මෙයට හේතුව ඔවුන්ගේ අරමුණ නිවනම පමණක් වීමයි.

එක් අවස්ථාවක සැරියුත් මහතෙරුන් වහන්සේ බුදුන් වහන්සේ හමු වී මෙලෙස ප්‍රකාශ කළහ. භාග්‍යවතුන් වහන්ස, "යම් හෙයකින් මේ ශාසනය බොහෝ කල් පවතින්නක් වන්නේ ද එසේ හෙයින් භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන්ට ශික්ෂාපද පණවන සේක්වා. පාමොක් උදෙසන සේක්වා. භාග්‍යවතුන් වහන්ස, මේ එයට කාලයයි" යනුවෙනි.

බුදුන් වහන්සේ ඊට පිළිතුරු වශයෙන් මෙසේ වදාළ සේක. "ශාරිපුත්‍රයනි, බලාපොරොත්තු වෙමු, තථාගතයන් වහන්සේ එයට කල් දන්නේය. යම්තාක් මේ ශාසනයෙහි ආශ්‍රවයන් ඉපදවීමට ආධාර වූ ඇතැම් ධර්මයෝ සංඝයා කෙරෙහි නොපහළ වෙත් ද, සංඝතෙම චිර රාත්‍රඥයන්ගෙන් මහත් බවට නොපැමිණියේ වේද, සංඝතෙම ස්ථවිර, මධ්‍යම, නවකයන් වශයෙන් විපුලත්වයට, මහත්වයට නොපැමිණියේ වේද, සංඝතෙම ලාභයෙන් මහත් බවට නොපැමිණියේ වේද, සංඝතෙමේ බහුශ්‍රැතයන් මහත් බවට නොපැමිණියේ වේද, ඒතාක් මේ ශාසනයෙහි සංඝයා කෙරෙහි ඇතැම් ආසවට්ඨානීය ධර්මයෝ පහළ නොවෙත්. ශාරිපුත්‍රයෙනි, ඉක්බිති ශාස්තෘ තෙමේ එම ආසවට්ඨානීය ධර්ම නැසීම පිණිස ශ්‍රාවකයන්ට ශික්ෂාපද පණවයි, පාමොක් උදෙසයි. ශාරිපුත්‍රයෙනි, භික්ෂු සංඝ තෙමේ වනතුරු නිරර්බුදය, නිදොස්ය, දුසිල් මහණුන්ගෙන්

---

**© පනාමුරේ චන්දිම හිමි**

**ධර්ම ශාස්ත්‍ර විමංසා - ආචාර්ය බෝදාගම චන්දිම නාහිමි අභිස්තුති සංග්‍රහය - දෙවන වෙළුම**

**සංස්කරණය: පස්ගොඩ සුමිත්ත හිමි, සූරියවැව සුමේධ හිමි, ගුරුගොඩ සිරිවිමල හිමි**

**තොරය, පිරිසිදුය, සිල් ආදි සරු දහමෙහි පිහිටියේය. ශාරිපුත්‍රයෙනි, මේ පන්සියයක් මහණුන් අතරින් යම් පසුළු මහණෙක් වේද හෙතෙම සෝවාන්ය, අපායෙහි නොවෙන සුලුය, නිවණට නියතය, සම්බෝධියම පිහිට කොට ඇත්තේය."**

මෙම විස්තරයට අනුව විනය ශික්ෂාපද පැණවීම සඳහා අවස්ථාවක් යෙදීමට පහත සඳහන් කරුණු සම්පූර්ණ විය යුතුය.

1. විවිධ ආශ්‍රව ධර්ම ඉපදීමට හේතු වන කරුණු පහළ වීම.
2. මහණව බොහෝ කල් ගත වීම.
3. භික්ෂු සංඝයා මහා පරිමාණයෙන් වර්ධනය වීම.
4. ලාභ සත්කාර වැඩිවීම.
5. උගතුන් බහුශ්‍රැතයන් වැඩිවීම.

මෙම කරුණු වලින් භික්ෂු සංඝයා දූෂණය වී පිරිහීමට ගිය විට පමණක් විනය ශික්ෂාපද පැණවීම අවශ්‍ය බවත් එසේ නොවන තුරු එවැනි විනය නීති පැණවීමක් අවශ්‍ය නොවන බවත් ඉහත සඳහන් විස්තරයෙන් හෙළි වෙයි.

මේ තත්ත්වය පැවතියේ දසක දෙකක් වැනි සුළු කාලයක් තුළ පමණකි. බුද්ධත්වයෙන් විසි වෙනි වස එළඹෙන විට භික්ෂු ශාසනයෙහි නොයෙක් අර්බුද වර්ධනය වෙමින් පැවතිණි. බුදුන් වහන්සේ විසින් දක්වා ඇති ඉහත සඳහන් හේතු පහ හැරුණු විට ඊටම ඇතුළත් කළ හැකි විවිධ හේතූන් රාශියක් මේ වන විට භික්ෂු සමාජය තුළ පැන නැගී පැවැති බව පෙනේ. ඒ කරුණු මොනවාදැයි විමසා බලමු.

විවිධ පරමාර්ථ ඇතිව පැවිදි වූ අය බහුල වීම මහාවග්ග පාලියෙහි මේ පිළිබඳව දක්වා ඇති විවිධ පරමාර්ථ නම්,

1. අන්‍යතීර්ථකයන් ලාභ සත්කාර ලබා ගැනීමේ අදහසින් පැවිදි වීම.
2. ජීවක වෛද්‍යවරයාගෙන් ලෙඩ සුව කරගැනීම සඳහා පැවිදි වීම.
3. සේනාවෙහි භටයන් එයින් පලාගොස් පැවිදි වීම.
4. දඬුවමින් මිදීම සඳහා සොරුන් පැවිදි වීම.
5. දඬුවම් විඳි පුද්ගලයන් ලැජ්ජාව නිසා පැවිදි වීම.
6. දාසකමින් මිදීම සඳහා දාසයන් පැවිදි වීම.
7. ඉගෙන ගැනීමට අලස අය පැවිදි වීම.
8. වැඩට අකමැති අය පැවිදි වීම.
9. බරපතළ පව් කළ අය විපාකවලින් මිදීමට පැවිදි වීම.

මෙම පරමාර්ථ සියල්ලෙන් ම හැඟෙන්නේ ඔවුනොවුන්ගේ පුද්ගලික වුවමනාවන් ඉටු කර ගැනීමට පැවිදි බිමට පත් වූ බවයි. ඔවුන් ශාසන බ්‍රහ්මචරියාවෙහි හැසිරීම වෙනුවට පවිටු අදහස් මුදුන්පත් කොට ගෙන එතෙක් නිර්මලව පැවති සඟ සසුන කිළිටි කළ බව සඳහන්ය. මේ නිසා බුදුන් වහන්සේට මේ අය පැවිදි නොකළ යුතු යැයි නාමාවලියක් ගෙන හැර දක්වන්නට සිදු විය. "එසේ පැවිදි නොකළ යුතු අයවලුන් ගණයට ගැනෙන කුදුන් කොරුන්, අංග විකල වූවන් සුව කළ නොහැකි ලෙඩුන් හා සමාජ රෝගීන්, අඳ, ගොළු, බිහිරි අයවලුන් වැනි අය ද සිටී." මෙම හේතු

කරණකොට ගෙන පශ්චාත් කාලීන භික්ෂු සමාජය ක්‍රම ක්‍රමයෙන් පිරිහී ගිය බව පැහැදිලිය.

මේ අනුව විවිධ අදහස් සිතුම් පැතුම් හා ආකල්පවලින් වෙනස් වූ පිරිසක් එකම සමාජයක් තුළ ගොණු වී ජීවත් වීමට සිදු වුවහොත් ඔවුනොවුන් අතර විවිධ ප්‍රශ්න ඇති වීම සාමාන්‍ය සිදුවීමකි. බුද්ධ සාසනයෙහි පැවිදි වූ සියල්ලෝ ම ගුණදම් අතින් සමානකම් ඇත්තවුන් නොවේ. ඔවුන් උපන් පෙදෙස් හා පෙර ගත කළ ජීවිතය අනුව, ආශ්‍රය කළ ගුරුවරුන් අනුව පමණක් ම නොව ඔවුන්ගේ වයස දැනුම ආගම හා භාෂාව ආදි විවිධ මට්ටම් අනුව ද සලකා බැලමේ දී බුදුන් වහන්සේ ළඟ පැවිදි වූ පිරිස අතිශයින් සංකීර්ණ වූවන් හැටියට හැඳින්වීම නිවැරදිය. ඔවුනොවුන්ගේ හැසිරීම් රටාව එකකට එකක් වෙනස්ය. එබඳු සංකීර්ණ සමාජයක සාමාජිකයන් අතර නොයෙක් කරුණු මුල් කරගෙන වාද විවාද ඇති වීම අනිවාර්ය සිද්ධියකි. එහිදී ඔවුන් තුළින් පැන නගින විවිධ ප්‍රශ්නයන් විසඳීම ඉතා අසීරු කරුණකි. මේ අනුව භික්ෂු සමාජයේ පැනැ නැගුණු මුල්ම බෙදීම වශයෙන් හඳුන්වනු ලබන්නේ බුද්ධත්වයෙන් දස වැනි වස ඇති වූ කොසඹෑ නුවර භික්ෂූන්ගේ අරගලයයි. "උගතුන් බහුශ්‍රැතයන් වැඩි වීම භික්ෂූන් අතර වූ විනය පිරිහීමට හේතුවන බවත්, ඒ නිසාම විනය නීති පැනවීමට සිදු වන බවත්, බුදුන් වහන්සේ එක්තරා අවස්ථාවක දී දේශනා කොට තිබේ." උගතුන් බහුශ්‍රැතයන් වැඩි වීම නිසා සුළු කාරණාවකට වුව ද මතිමතාන්තර පැන නැගී වාද විවාද හටගනියි. වරද පිළිගැනීමට එකම පක්ෂයක් හෝ කැමති කරවා ගැනීමට නොහැකි වන්නේ වාදයකදී දෙපක්ෂය ම එක තරමටම තර්ක විතර්කවල යෙදෙමින් තමන් ගත් මතය මදකින් හෝ අතහරින්නට අකමැති වීම නිසාය. කොසඹෑ නුවර අරගලය හට ගත්තේ මෙකී හේතුව නිසාය.

එමෙන් ම නොදැන කළ එක් සුළු වරදක් නිසා, ඇවතක් සිදු වූයේ ද නැද්ද යන්න තර්කය මත විනයධරයෝ හා ධර්මධරයෝ දෙපක්ෂයකට බෙදුණාහ. එයින් විනයධරයෝ එහි වරදක් ඇතැයි කීහ. ධර්මධරයෝ වරදක් නැතැයි කීහ. ශාසනික වශයෙන් හෝ ප්‍රතිපත්ති වශයෙන් එතරම් වැදගත් කමක් නැති මෙම සුළු සිද්ධියට පවා ධර්මධරයන් හා විනයධරයන් සඟ සසුනෙහි මහා පෙරළියක් සිදු කොට අවසානයේ දී බුදුන් වහන්සේට පවා සමථයකට පත් කළ නොහැකි උග්‍ර මත භේදයකට පෙරළා ගන්නා ලද්දේය. මෙහි විනයධර හා ධර්මධර යන දෙපාර්ශවය ම ඒ ඒ අංශවල උගත්තු වූහ. එම නිසා එකම පක්ෂයක්වත් යටත්වීමට හෝ පරාජය පිළිගැනීමට අකමැති වූහ.

කොසඹෑ නුවර භික්ෂු අර්බුදය නිමාවීමට සාරමසක් පමණ ගත විය. එය නිමා වූයේ ද සත්‍ය අවබෝධවීමෙන් නොව දායකයන්ගේ බලපෑම් නිසාවෙනි. මෙම අරගලය තාවකාලික එකක් වුවත් අනාගත භික්ෂු පරපුරට එය මනාකොට බලපෑම් සිදුවිය. බුද්ධ කාලයේම මෙන් ම සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ඇති වූ ශාසන අර්බුදවලට එය පෙරහුරුවක් විය. එතෙක් රැකගෙන ආ සංඝ සාමග්‍රියට එය මහත් තර්ජනයක් විය. "සුඛා සංඝස්ස සාමග්ගි" යනුවෙන් සංඝ සමාජයේ සමගියෙහි ඇති වැදගත්කම බුදුන් වහන්සේ විසින් මහත් ඉහළින් වර්ණනා කළ නමුත් ඒ තත්වය බුදුන් වහන්සේ ඉදිරිපිටදීම සැහැල්ලුවට පත් කරන ලදි. එනමුත් කලහය සංසිඳීමෙන් පසුව බුදුන් වහන්සේ අනුගමනය කළ පිළිවෙත එබඳු ශ්‍රේෂ්ඨ උත්තම ගණයේ ශාස්තෘවරයෙකුගෙන්

හැර වෙන කිසිම කෙනෙකුගෙන් බලාපොරොත්තු විය නොහැකිය. තවද කලහය අවසානයේ විශාඛා උපාසිකාව බුදුන් වහන්සේ හමුවට පැමිණ "ස්වාමීනි, දබරකරු වූ, විවාදකරු වූ, කලහ උපදවන අයුරින් කතා කරන්නා වූ, සංඝයා වෙත පැමිණිලි කරන්නා වූ ඒ කොසඹෑ නුවර භික්ෂූහු සැවැත් නුවරට පැමිණෙයි ද, ස්වාමීනි මම ඒ භික්ෂූන් කෙරෙහි කෙසේ පිළිපදිම් දැයි විචාළාය. "විශාඛාව එසේ නම් තෙපි දෙපක්ෂයට ම දන් දෙවු, දෙපක්ෂය වෙත දහම් අසා එහි යම් භික්ෂූහු ධර්මවාදී වෙත්නම් ඔවුන්ගේ ලබ්ධිය ද, ඉවසීම ද, කැමැත්ත ද, ගිනීම ද, රුචි කරවු." දරුවන්ගේ ලාමක පැවතුම් උපේක්ෂාවෙන් ඉවසා ඔවුන්ගේ යහපත ම ප්‍රාර්ථනා කරන සෙනෙහෙබර පියකු මෙන් බුදුන් වහන්සේ කලහකාරි භික්ෂූන් කෙරෙහි මෙත් සිත් පතුරුවා නොදැන කළ වරදට සමාව දී නැවත ඔවුන් නිසි මඟට යොමු කිරීමට ගත් ප්‍රයත්නයක ස්වරූපය ඉහත සඳහන් ප්‍රකාශනයෙහි ගැබ්ව ඇත. ඉන් අනතුරුව විශාල වශයෙන් සසුනට බලපෑම් එල්ල වූ නොයෙක් චරිත සංඝ සමාජය තුළ පහළ වන්නට විය. ඒ අතර දෙව්දත් තෙරුන් එක් අයෙකි.

බුදුන් වහන්සේගේ සන්සුන් දිවි පැවැත්මට හා සංඝ සාමග්‍රියට නොයෙක් අයුරින් බාධා කළ එක් භික්ෂුවක් ලෙස දේවදත්ත තෙරුන් හැඳින්විය හැකිය. උන්වහන්සේ ද වංශයෙන් බුදුන් වහන්සේ අයත් ශාක්‍ය වංශයට ම අයත් වූවෙකි. අනෙකුත් ප්‍රධාන පෙළේ ශාක්‍ය කුමරුන් සමග සැදැහැ සිතින් පැවිදිව භාවනා කොට පංචාභිඥා අෂ්ටසමාපත්ති ලාභියෙක් විය. මෙසේ ගිහි පැවිදි දෙපක්ෂයෙන් ම ශාසනික දායාදය ලැබූ එතුමා බුදුන් වහන්සේ සමග විරුද්ධ වන්නට පැහැදිලි හේතුවක් පෙනෙන්නට නැත. සම්ප්‍රදායික පිළිගැනීමට අනුව දේවදත්ත තෙරුන් පෙර ආත්මවලදී බෝධිසත්වයන් හට පරම විරුද්ධකරුවෙකු වශයෙන් ක්‍රියා කරන්නට විය. ජාතකපාළිය මේ සඳහා සාක්ෂි දරනු ලබයි. එකී වෛරය මේ ආත්මයේ දී පවා බල පාන්නට ඇතැයි යනු සාමාන්‍ය පිළිගැනීමයි.

ඒ හැර දෙව්දත් තෙර බුදුන් වහන්සේ සමග විරුද්ධ වන්නට කුමක් හේතු වූයේ ද යන්න පැහැදිලි නැත. බුදුන් වහන්සේ ඝාතනය කොට තමා බුදු බව ගන්නේ යැයි යන මතය බොළඳ එකකි. බුදුන් වහන්සේ කෙරෙහි අපමණ ශ්‍රද්ධාවකින් යුතුව බණ අසා භාවනා කොට පංචාභිඥා ලැබූ කෙනෙකුට බුදුන් මරා බුදුවන්නෙමියි යන මූර්ඛ අදහසක් කිසිමදාක ඇති විය නොහැකිය. මේ පිළිබඳ චුල්ලවග්ග පාළියෙහි එන විස්තරය මෙසේය.

> "එසමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ රජු සහිත
> මහත් පිරිසක් විසින් පිරිවරන ලදුව දහම් දෙසමින්
> හුන් සේක. එකල්හි දෙව්දත් තෙරණුවෝ හුනස්නෙන්
> නැගිට උතුරු සඟළ සකස් කොට පොරවා භාග්‍යවතුන්
> දෙසට දොහොත් නමා වැඳ මෙසේ කීය. වහන්ස,
> දැන් භාග්‍යවතුන් වහන්සේ ජීර්ණ සේක. මහලු වූ
> සේක. දීර්ඝ කාලයක් ගතකළ සේක. පැසීම් වයසට
> පැමිණි සේක. භාග්‍යවතුන් වහන්ස, දැන් භාග්‍යවතුන්
> වහන්සේ මන්දෝත්සාහී වන සේක්වා. දෘෂ්ටධර්ම

ධුත විහරණයෙහි යෙදී වසන සේක්වා. භික්ෂු සංඝයා මට භාර දෙන සේක්වා. මම භික්ෂු සංඝයා පරිහරණය කරන්නෙමි" මෙබස් කීය

"දෙව්දතුනි, කම් නැත, භික්ෂු සංඝයා පරිහරණය කරන්නට රිසි නොවේවා" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

මෙම ඉල්ලීම දෙව්දත් තෙරුන් දෙවැනි හා තෙවැනි වතාවටත් ඉල්ලුම් කරන ලද්දේය. තෙවැනි වාරයේ දී බුදුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"දෙව්දතුනි, මම සැරියුත් මුගලන් දෙදෙනාට ද භික්ෂු සංඝයා භාර නොදෙන්නෙමි. කිමෙක් ද? කෙළ බුදින ඔබට භික්ෂු සංඝයා භාර දෙම් ද? භාර නොදෙමි" යි වදාළ සේක.

මෙයින් කිපුණු දෙව්දත් තෙරුන් භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්ම ගියේය. මෙය භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි දෙව්දතුන්ගේ පළමු වෛරය විය. චුල්ලවග්ග පාලියෙහි එන මෙම ප්‍රවෘත්තියට අනුව දෙව්දත් තෙරුන් බුදුන් වහන්සේ සමග පළමු වතාවට විරුද්ධ වූයේ තමන්ට භික්ෂු සංඝයාගේ පාලනය භාර නොදීමත්, ප්‍රභූවරුන් මැද කෙළ තොලු වාදයෙන් නින්දාවට පත් කිරීමත් හේතුවෙනි. දෙව්දත් තෙරුන් වනාහි එකල බුදුන් වහන්සේගේ අදහස් අනුමත නොකළ නිසාම උන්වහන්සේ සමග අමනාපයෙන් පසු වූ භික්ෂු පිරිසක් විසින් මෙහෙයවනු ලැබූ ඔවුන්ගේ නියෝජිතයෙකු විය නොහැකි ද? යන්න ගැටලුවකි. බුද්ධත්වයෙන් දසවැනි වසෙහි වූ කොසඹෑ නුවර භික්ෂූන්ගේ අරගලයෙහි ම තවත් කොටසක් හැටියට දෙව්දත් තෙරුන්ගේ කැරැල්ල හැඳින්විය හැකිය. එදා එකී අරගලය මෙහෙයවන ලද්දේ ධර්මධර විනයධර දෙපක්ෂයේ භික්ෂූන් විසිනි. විනයධර භික්ෂූන්ගේ ඉල්ලීම් පසක් ලෙස දෙව්දත් තෙරුන්ගේ ආයාචනා පස දැක්විය හැකිය. දෙව්දත් තෙරුන් ද මෙම විනයධර පක්ෂය ගත් එක්තරා භික්ෂුවක් විය යුතුය. නැති නම් එම පක්ෂයේ නායකයා විය යුතුය. එම ඉල්ලීම් පස මෙසේය.

1. භික්ෂූහු දිවිහිම් කොට ආරණ්‍යවාසී විය යුතුය.
2. භික්ෂූහු දිවිහිම් කොට පිණ්ඩපාතික විය යුතුය.
3. භික්ෂූහු දිවිහිම් කොට පාංශුකූලික විය යුතුය.
4. භික්ෂූහු දිවිහිම් කොට වෘක්ෂමූලික විය යුතුය.
5. භික්ෂූහු දිවිහිම් කොට මස් මාංශ නොවැළඳිය යුතුය.

මෙකී ඉල්ලීම් පසට අයත් කරුණු වෙන් වෙන්ව ගත් කල ඒ සියල්ලම විනයට කැඩුණු කරුණු පසක් හැටියට විග්‍රහ කළ හැකිය. මෙම අවස්ථාව වන විට විනයවාදීන්ගේ බලය ධර්මවාදීන්ගේ බලය අභිබවා තිබෙන්නට ඇත. බුදුන් වහන්සේ

තමන්ගේ පක්ෂයට හරවා ගැනීමට අදහස් කළ ඔවුහු දෙව්දත් තෙරුන් මගින් එකී ඉල්ලීම් පස ඉදිරිපත් කරන්නට ඇති බවය. බුදුන් වහන්සේ එම ඉල්ලීම් පිළිගන්නේවත් ප්‍රතික්ෂේප කරන්නේවත් නොමැතිව කැමති නම් පිළිගන්නටත් අකමැති අය නොපිළිග න්නටත් අවසර දීමෙන් විනයධරයෝ බුදුන් වහන්සේ සමග නොසතුටුව දෙව්දත් තෙරුන් නායකයා කොට වෙනම විරුද්ධ පක්‍ෂයක් ගොඩ නැගූහ. මෙම කාරණාව මුල් කරගෙන විනය ගරුක කරන බොහෝ දෙනෙකුත්, අලුත පැවිදි වූවන් පිරිසකුත් විනයවාදීන්ගේ පක්ෂයට එක්වූහ. දෙව්දත් තෙරුන් එකී ඉල්ලීම් පස ඉදිරිපත් කරන ලද්දේ ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යස්ථ මතය ගරු කරන බුදුන් වහන්සේ කිසි දිනෙක එවැනි දැඩි විනය නීති මාලාවක් භික්ෂූන් සඳහා නොපණවන බව හොඳින් දැන දැනමය. බුද්ධකාලීන භික්ෂු සමාජයේ සංඝයා අතර අර්බුද ඇති කරලීමට දෙව්දත් තෙරුන්ගේ එම ක්‍රියාමාර්ගයන් බෙහෙවින් බලපාන්නට වූයේය.

තවද බුදුන් වහන්සේ සමග නොයෙකුත් හේතු නිසා අමනාපකම් ඇති කරගත් පිරිසක් එකල සංඝ සමාජයේ වූහ. එයින් එක් අයෙකු වූයේ කලක් බුදුන් වහන්සේගේ උපස්ථායකයෙකු වශයෙන් සිටි පසුව උන්වහන්සේ අතහැර ගොස් සිවුරු අත්හල සුනක්ඛත්ත නම් භික්ෂුවයි. දෙව්දත් තෙරුන් මෙන් ම ඔහු බුදුන් වහන්සේට දැඩි විරුද්ධත්වයක් නොදැක්වූ නමුත් උන්වහන්සේ ගැන වැරදි මත පළ කරමින් එක්තරා ආකාරයකට අපහාසයට ලක් කළේය. මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් දීඝනිකායෙහි පාටික සූත්‍රයෙහි සඳහන් වේ. "තමාට දැනගන්නට සෘද්ධි ප්‍රාතිහාර්ය නොපානා හේතුවෙන් හා තමාට ලෝකෝත්පත්ති කථාව ප්‍රකාශ නොකරන හේතුවෙන් සුනක්ඛත්ත භික්ෂුව බුදුන් වහන්සේ කෙරෙහි කලකිරී උන්වහන්සේට තර්ජනය කොට අත්හැර යන්නට සූදානම් විය. එවිට බුදුන් වහන්සේ ඔහුට කතා කොට සෘද්ධි ප්‍රාතිහාර්යය පෑවත් නොපෑවත් ලෝකෝත්පත්තිය ප්‍රකාශ කළත් නොකළත් එය දුක නැති කිරීමට හේතුවක්වත් නිවන් දැකීමට බාධාවක්වත් නොවන බව දේශනා කළහ." සුනක්ඛත්ත තෙරුන් එයින් සෑහීමකට පත් නොවී බුදුන් වහන්සේ කෙරෙහි තවදුරටත් කලකිරීමට පත් විය. ඊට පෙර දිනයක මොහු බුදුන් වහන්සේ සමග පිඬු සිඟා යන අවස්ථාවක බලු තපස් රකින කොරක්ඛත්තිය නම් නිරුවත් තවුසෙකු දැක ඔහු කෙරේ පැහැදුණේය. තවත් දිනෙක එබඳුම කාළාරමට්ටුක නම් අචේලක තවුසෙකු දැක ඔහු කෙරෙහි බැඳුණේය. නැවත වරක් පුරසාරම් දොඩන පාටික නම් තවුසෙකු කෙරෙහි බැඳුණේ ය. අවසානයේ දී සඳහන් කළ සෘද්ධි ප්‍රාතිහාර්යය ගැන කලකිරී සිවුරු හැර ගියේය. සිවුරු හැර ගිය පසු ද සුනක්ඛත්ත තෙම භාග්‍යවතුන් වහන්සේට නින්දා අපහාස සිදු කළේය. "ශ්‍රමණ ගෞතමයන් හට මනුෂ්‍ය ධර්මයෙන් වැඩි ආර්යභාවය පිණිස සමත් වූ ඥාන දර්ශන විශේෂයන් නැත. ශ්‍රමණ ගෞතම තෙම තර්කයේ පිහිටා, විමසුම් නුවණින් ගළපා, තමාම අවබෝධ කරගත් ධර්මයක් දේශනා කරයි. දුක් කෙළවර කර ගැනීමට කැමැත්තවුන්ට එයින් යහපතක් ම සිදු වෙයි." යනාදී වශයෙන් විශාලා මහනුවර පිරිස් මැද කියමින් සංචාරය කළේය.

මේ පුවත ඇසූ බුදුන් වහන්සේ සැරියුත් තෙරුන් වහන්සේ අමතා මෙසේ කීහ. "සුනක්ඛත්ත හිස් පුරුෂයා මට නින්දා ගෙන දෙන සේ එසේ කළත් එයින් මගේ ගුණයක් ම කියවේය. මාගේ ධර්මයට අනුව ක්‍රියාකරන්නෙකුගේ දුක් කෙළවර කිරීමට එය මැනවින් උපකාර වන්නේ යැයි යන කියමන සත්‍යයක්මැයි" වදාළහ. සුනක්ඛත්ත

භික්ෂුව පශ්චාත් කාලීනව මෙලෙස අවිනීතව හැසිරුණ ද මුල් කාල සීමාව තුළ ත්‍රිවිධ රත්නයෙහි සූවිසි මහා ගුණයන් ප්‍රකාශ කරමින් නොසෑහෙන පරිදි ගුණ ප්‍රකාශ කළ පැවිද්දෙක් විය. ඉක්මණින් පැහැදෙන හා ඉක්මණින් කලකිරෙන ස්වභාවය මොහුගේ ඇති දුර්වලතාවයක් බව ද බුදුන් වහන්සේ දේශනා කළහ.

මොහුගේ මෙම නොමනා ක්‍රියාකලාපය නිසා කිසිදු ආකාරයක හානියක් බුදු දහමට නොවූවත් සුළු වශයෙන් යම් ධර්ම සංවේගයක් බුදුන් වහන්සේට ඇති වන්නට ඇත. ඒ බව බුදුන් වහන්සේගේ "මොඝ පුරිස" යනුවෙන් කළ ප්‍රකාශයෙන් මනාව පැහැදිලි වේ. දිනක් සුනක්ඛත්ත තෙමේ බුදුන් වහන්සේ සමීපයට පැමිණ දිවකන් ලබා ගැනීමට අවශ්‍යය වත් පිළිවෙත් විචාළ කල්හි බුදුන් වහන්සේ මොහුගේ අතීත චරිතය බලා එවැන්නක් ලැබීමට තරම් වාසනා මහිමය නැති බව දැන ඒ පිළිවෙත් ප්‍රකාශ නොකිරීම හේතුවෙන් බුදුන් වහන්සේ කෙරෙහි වෛර බැඳගන්නට ඇතැයි සඳහන් වේ.

තවද බුද්ධ කාලයේ දී බුදුන් වහන්සේට දැඩි ලෙස විරුද්ධව ක්‍රියා නොකළමුත් උන්වහන්සේට අකීකරුව, අසංවරව හැසුරුණු කීප දෙනෙක් ද ඒ අතර සිටියහ. එයින් ඡන්න භික්ෂුව ප්‍රමුඛ වේ. මහාපරිනිබ්බාන සූත්‍රයෙහි සඳහන් වන පරිදි "බුද්ධපරිනිර්වාණයෙන් පසුව ඔහුට බ්‍රහ්ම දණ්ඩනය නියම කරන ලෙස නියම කොට තිබුණි." බ්‍රහ්ම දණ්ඩනය යනු එකල වූ දඬුවම් ක්‍රම අතරින් ප්‍රසිද්ධ දඬුවමකි. එයින් අදහස් කරන්නේ කිසිවෙක් ඔහු සමග කතා නොකොට ඔහුව වර්ජනය කිරීමයි. ඡන්න භික්ෂුවගේ මුරණ්ඩුකම හේතුවෙන් ඔහුට මෙම දණ්ඩනය නියම කරන්නට යෙදුණි. තමා හට වඩා අන් අයට වැඩි සැලකිල්ලක් දැක්වීම හේතුවෙන් ඡන්න භික්ෂුව බුදුන් වහන්සේ සමග අමනාප විය. බුදුන් වහන්සේ සිද්ධාර්ථ කුමාර අවධියෙහි දී ගිහිගෙ යින් නික්ම යන විට උපකාර කළේ තමා නමුත් ඒ පිළිබඳ නොසලකා පසුව පැවිදි වූ සැරියුත් මුගලන් දෙනමට උසස් තනතුරු ලබා දීම තමාට කිසිවක් ලබා නොදීම හේතුවෙන් විශාල අසාධාරණයක් තමාට වූ බව ඔහුගේ හැඟීම විය. බුදුන් වහන්සේ ඡන්න භික්ෂුවට කෙතරම් අවවාද කළ ද ඒ පිළිබඳ ගණනකටවත් නොගෙන තම මතයෙහි ම ගැලී සිටියේය. කෙසේ වෙතත් බුද්ධපරිනිර්වාණයෙන් පසුව ඔහුට බ්‍රහ්ම දණ්ඩනය ලබා දීමෙන් අනතුරුව පසු කාලීනව ඔහු සුවච කීකරු භික්ෂුවක් විය.

එවැනිම අකීකරු භික්ෂුවක් පිළිබඳ ධම්මපදට්ඨකතාවෙහි සඳහන් වේ. ඒ බහුභණ්ඩික කතාවයි. එක් භික්ෂුවක් බොහෝ සිවුරු පිරිකර ඇතිව ජීවත් වූහ. භික්ෂූන් වහන්සේලා ධර්ම චාරිකාවෙහි යන අතරතුර මෙම භික්ෂුව ළඟ බොහෝ සිවුරු පිරිකර තිබෙනු දැක බුදුරජාණන් වහන්සේට සැල කර සිටියහ. බුදුන් වහන්සේ දම් සභා මණ්ඩපයට රැස් වූ අවස්ථාවක ඔහු කැඳවා ඒ පිළිබඳ ඔහුගෙන් ම විමසා දැන ඔහුට අවවාද කොට සිටියේය. ඔහු බහුභණ්ඩික වීමෙහි හේතු සාධක ද පෙන්වා දුන්හ. එසේ නම් භික්ෂුවක් නිරුවත්ව සිටිය යුතුදැයි අසමින් ඔහු තම හැඳ සිටි සිවුරු ගලවා විසි කළේය. බහුභණ්ඩික භික්ෂුව ද බුද්ධ ශාසනයේ යම් තරමකින් අර්බුදයක් ඇති කළ භික්ෂුවක් වශයෙන් හැඳින්විය හැකිය.

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ උතුම් ධර්මය නිවැරදිව වටහා නොගත් විශාල පිරිසක් එකල වූහ. මජ්ඣිම නිකායෙහි අලගද්දූපම සූත්‍රයෙහි එන

ගන්ධබාධිපුත්ත අරිට්ඨ භික්ෂුව ඉන් කෙනෙකි. මෙම භික්ෂුව බොහෝ ලෙස මුලාවට පත්ව සිටි භික්ෂුවකි. බුදුන් වහන්සේ නිර්වාණයට අන්තරාකරයැයි දේශනා කරන ලද බොහෝ දේශනා එසේ නොවේයැයි දේශනා කරන්නට වූහ. උන්වහන්සේගේ වැරදි වැටහීම දුරු කරනු පිණිස බුදුන් වහන්සේ නොයෙක් උපමා ආදිය ගෙන හැර දක්වමින් ධර්මය දේශනා කළ නමුදු ඉන් එකකිනුදු කිසිම ඵලක් නොවීය. ඒ අනුව බුදුන් වහන්සේ, "මේ ගන්ධබාධිපුත්ත අරිට්ඨ මහණ තෙමේ තමා වරදවා ගත් මිථ්‍යා දෘෂ්ටියෙන් අපට ද අභ්‍යාඛ්‍යානය කරයි. තමන් ගුණ ද කණියි. බොහෝ අකුසල් ද රැස් කරයි. එය ඒ හිස් පුරුෂයාට බොහෝ කලක් අහිත පිණිස පවතින්නේ ය" යි වදාළ සේක.

බුද්ධ ධර්මය වැරදිව වටහා ගත් අයෙක් වශයෙන් කේවට්ටපුත්ත සාති භික්ෂුව හැඳින්විය හැකිය. සතත්වයෙකු මරණයට පත් වූ පසු ඔහුගේ ආත්මය සසර සැරිසරන බව සාති භික්ෂුවගේ විශ්වාසය විය. මෙය වනාහි බුද්ධ දේශනාවට හාත්පසින් ම විරුද්ධ ශාස්වත දෘෂ්ටියට ඇතුළත් බරපතල මිථ්‍යා අදහසකි. "එබඳු ඉගැන්වීමක් බුද්ධ ධර්මය තුළ නොමැත. එවැනි අදහසක් ඔබට ඇත්දැ"යි බුදුන් වහන්සේ විචාළ සේක. "එසේ යැයි" පිළිවදන් දුන් කල්හි භාග්‍යවතුන් වහන්සේ "මෝඝ පුරුෂය, තෝ කවරක් හට නම් මා මෙසේ දම් දෙසුවා යැයි දන්නෙහි ද, මා විසින් යම් අයුරින් විඤ්ඤාණය ප්‍රත්‍යසමුප්පන්න යයි ප්‍රත්‍යයෙන් විඤ්ඤාණ සම්භවයක් නැතැයි වදාරණ ලද්දේ නොවේ ද? ඒ මතු ද, මෝඝ පුරුෂය, තෝ තමා වරදවා ගත් ධර්මයෙන් අපට ද අභ්‍යාඛ්‍යානය කරහි, තමා පෙළෙයි, බොහෝ අකුසල් උපදවා ගනියි, මෝඝ පුරුෂය, ඒ පවිටු අදහස තට දීර්ඝ රාත්‍රියෙහි අහිතයට ද, දුකට ද හේතු වෙයි." වදාළ සේක.

චුල්ල මාලුංක්‍යපුත්ත තෙරුන් වහන්සේ බුදුන් වහන්සේට එක්තරා අභියෝග යක් ඉදිරිපත් කළ භික්ෂුවකි. ඔහුගේ අභියෝගය වූයේ ලෝකය ශාස්වත ද, අශාස්වත ද? ලෝකය අන්වත් ද, අනන්තවද්ද? ජීවයම ශරීරය ද, නැද්ද? සත්ත්වයා මරණින් මතු ඇත් ද, නැද්ද? මෙම ප්‍රශ්න වලට බුදුන් වහන්සේ ඍජුව ම පිළිතුරු නොදුන්නහොත් තමා පැවිදි ජීවිතයේ මොහොතක්වත් නොසිට උපැවිදි වන බව දන්වා සිටිමියි. බුදුන් හමුවට ගොස් මෙම ප්‍රශ්න මාලාව ඉදිරිපත් කොට පිළිවදන් එකහෙළා නොදුන්නහොත් සිවුරු හැර යන බවත් ඍජුවම පිළිතුරු දෙන මෙන් බුදුන් වහන්සේගෙන් ඉල්ලා සිටියේය. එවිට බුදුන් වහන්සේ, "මාලුංක්‍යපුත්තය, ඇයි ඔබ පැවිදි වීමට පෙර මෙම ප්‍රශ්නවලට මා පිළිතුරු දෙන බව ඔබට පොරොන්දු වී සිටියාදැ"යි විචාළ සේක. "නැත" යනු මාලුංක්‍යපුත්තගේ පිළිතුර විය. එකල බුදුන් වහන්සේ මාලුංක්‍යපුත්තට දහම් දෙසා "මාලුංක්‍ය පුත්‍රය, මෙහි මා විසින් ප්‍රකාශ නොකරන ලද්ද ප්‍රකාශ නොකරන ලද හෙයින් දරන්නේය. මා විසින් ප්‍රකාශ කරන ලද හෙයින් දරන්නේ ය" යි.

මාලුංක්‍යපුත්‍රය වැළිත් මා කුමක් නොකියන ලදද? මාලුංක්‍ය ලෝකය ශාස්වත යැයි මම නොකියන ලද්දෙමි. සත්ත්වයා මරණින් මතු වන්නේ යැයි මා විසින් නොකියන ලද්දේ ය. මාලුංක්‍යපුත්‍රයත්, කුමක් හෙයින් මා විසින් එය නොකියන ලද්දේද යත්, මාලුංක්‍යපුත්‍රය, එය අර්ථ සහිත වූවක් නොවේ. මාර්ග බ්‍රහ්මචරියාවට මුල් වූ සීලයට ද හේතු වූවක් නොවේ. එය නික්මීම පිණිස, නිවීම පිණිස, සංසිඳීම පිණිස හේතු නොවෙයි. එමෙන්ම රහත් බව හා නිර්වාණාවබෝධය පිණිස හේතු නොවේ.

එහෙයින් ඒවා මා ප්‍රකාශ නොකරන ලද්දේ ය. මා විසින් වැළිත් කුමක් ප්‍රකාශ කරන ලද්දේද යත්, මාලුංක්‍ය පුත්‍රය මෙය දුක යයි මා විසින් දේශනා කරන ලද්දේය. කුමක් හෙයින් ප්‍රකාශ කරන ලද්දේද යත්, එය අර්ථ සහිත වූවක් වෙයි. නිර්වාණාවබෝධය පිණිස හේතු වෙයි. එහෙයින් මා විසින් එය ප්‍රකාශ කරන ලද්දේය. එහෙයින් මාලුංක්‍ය පුත්‍රය, මෙහි මා විසින් යමක් ප්‍රකාශ නොකරන ලද්දේද එය ප්‍රකාශ නොකළ ලෙස පිළිගත යුතුය. යමක් ප්‍රකාශ කළේද එය ප්‍රකාශ කළ ලෙස පිළිගත යුතුය. මහත් ආන්දෝලනයකට තුඩු දුන් මෙම කාරණාව කෙසේ වෙතත් බුද්ධ දේශනාවෙන් අනතුරුව මාලුංක්‍ය පුත්ත භික්ෂුව සියල්ල සතුටින් පිළිගන්නට විය.

එමෙන් ම බුදුන් වහන්සේ භික්ෂූන්ට විකාල භෝජනය තහනම් කොට එක වරුවක් වැළඳීමට ශික්ෂා පද පැණවූ අවස්ථාවෙහි එයට විරුද්ධ එකී ශික්ෂා පදය පිළිගැනීමට අකමැති වූ එක් භික්ෂුවක් විය. එනම් ආයුෂ්මත් භද්දාලි තෙරුන් ය. බුදුන් හමුවට ගොස් උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කළහ. "ස්වාමීනි, මම ඒකාසන භෝජනය වළඳන්නට නොහැක්කෙමි. ඒකාසන භෝජනය වළඳන මට දිවි ඇති තෙක් රැකෙන්නට හැකි වේදැයි යන්න සැකයක් පවතී." යැයි පැවසුවේය. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ ඔහුට කාරණා පැහැදිලි කර දී එසේ ශික්ෂා පද නොපිළිග ැනීමෙන් මතුවට සිදු වන අනර්ථය පිළිබඳ පැහැදිලි කර දීමෙන් පසුව තමා කළ වරද පිළිගෙන හෙතෙම බුදුන් හමුවට ගොස් "භාග්‍යවතුන් වහන්ස, මම ඔබ වහන්සේ විසින් පණවන කල්හි භික්ෂු සංඝයා සිකපද සමාදන් වන කල්හි එහි උත්සාහ රහිත බව පැවසුවෙමි ද වහන්ස, බාලයෙකු සෙයින්, මෝඩයෙකු සෙයින්, අදක්ෂයෙකු සෙයින් අපරාධය මා ඉක්ම ගියේය. භාග්‍යවතුන් වහන්සේ ආයති සංවරය පිණිස මාගේ එම දෝෂය දෝෂයක් ලෙස සලකා සමාව දෙන සේක්වා" යි පැවසුවේය.

බුදුන් වහන්සේ කෙරෙහි නොව සැරියුත් මුගලන් දෙනම කෙරෙහි වෛරයෙන් පසු වූ එක්තරා භික්ෂුවක් ද විය. කෝකාලික නම් හෙතෙම දිනක් භාග්‍යවතුන් වහන්සේ සමීපයට පැමිණ, "භාග්‍යවතුන් වහන්ස, සැරියුත් මුගලන්හු ලාමක ඉච්ඡා ඇත්තාහු ලාමක ඉච්ඡාවෙහි වසඟයට ගියාහු" යි චෝදනා කළේය. මෙසේ කියා එතැනින් පිටව ගොස් මද වේලාවකට පසු ඔහුගේ සිරුර පුරා ගෙඩි මතුවී, ඒවා පැසවා බිඳී සැරව ගලන්නට විය. කෝකාලික නම් එම භික්ෂුව එම රෝගය හේතුවෙන් ම කලුරිය කොට පදුම නරකයෙහි උපන් බව සඳහන් වෙයි. සැරියුත් මුගලන් දෙනම කෙරෙහි අස්ථානයෙහි මෙසේ වෛර කළ මෙම භික්ෂුව දේවදත්ත තෙරුන්ගේ පක්ෂය ගත් කෝකාලික නොව එහි සිටි වෙනත් අයෙකු බව සඳහන් වේ.

මේ අකාරයෙන් බුද්ධ කාලීන භික්ෂු සමාජය නොයෙක් අර්බුදයනට පත් කිරීම පිණිස නොයෙක් හේතු සහ විවිධ පැවිද්දන් විසින් සිද්ධ කරන ලද බලපෑම උක්ත කරුණු ආශ්‍රයෙන් පැහැදිලි වේ. බුද්ධත්වයෙන් මුල් විසි වසෙන් අනතුරුව නොයෙක් භික්ෂූන්ගෙන් නොයෙක් බලපෑම් සිදු වූ අතර පිරිනිවන් මඤ්චකයෙහි වැඩ සිටි කාලය වනතුරුම ඒවායින් අඩුවක් නොවී ය. එනම් සුභද්‍ර නම් භික්ෂුවගේ අභද්‍ර වචනයයි. සුභද්‍ර භික්ෂුව බුද්ධ පරිනිර්වාණයෙන් පසු දින වාගේම ප්‍රථමයෙන් ම ශාසනික වශයෙන් මහත් ආන්දෝලනයකට තුඩු දුන් ප්‍රකාශයක් කිරීම හේතුවෙන් ප්‍රකට වූ අයෙකි. ඔහුගේ එම ප්‍රකාශය චුල්ලවග්ග පාළියෙහි පංචසතිකක්ඛන්ධකයෙහි හා දීඝනිකායේ

මහාපරිනිබ්බාන සූත්‍රයෙහි ද සඳහන් වේ. මෙම හේතුවම මූලික වශයෙන් ප්‍රථම ධර්ම සංඝායනාවට ද තුඩුදුන් බව පැහැදිලිය.

මේ අකාරයෙන් උක්ත සම්පිණ්ඩනය කරන ලද කරුණු පිළිබඳ මනා කොට විමර්ශනය කිරීමෙන් අනතුරුව බුද්ධ කාලීන සංඝ සමාජයේ ඇති වූ අර්බුද මෙන් ම එම අර්බුද ඇති වීමට හේතු සාධක වූ කරුණු පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත හැකිය.

## ආන්තික සටහන්

1. පාරාජිකා පාළි, 1972. භික්ෂුවිභංගය, වේරඤ්ජකාණ්ඩය, බු.ජ.මු. පිටුව 22.
2. -එම-, පිටුව 29.
3. මහාවග්ග පාළි, මහාඛන්ධකය, 1972 බු.ජ.මු. පිටු 178-194.
4. -එම-, පිටුව 226
5. පාරාජිකා පාළි, භික්ෂුවිභංගය, 1972 වේරඤ්ජකාණ්ඩය, බු.ජ.මු. පිටුව 22.
6. මහාවග්ග පාළි, උපෝසථක්ඛන්ධකය, 1972 බු.ජ.මු. පිටුව 884.
7. චුල්ලවග්ග පාළි, පරිවාසිකක්ඛන්ධකය, 1972 බු.ජ.මු. පිටුව 270.
8. -එම-, පිටුව 298.
9. දී.නි., (2), පාථිකසුත්ත, 1972 බු.ජ.මු. පිටුව 01.
10. ම.නි., (1), මහා සීහනාදසුත්ත, 1972 පිටුව 164.
11. -එම-, පිටුව 166.
12. "ඡන්නස්ස ආනන්ද භික්ඛුනො මමච්චයෙන බ්‍රහ්මදණ්ඩො දාතබ්බො" දී.නි., (2), මහා පරිනිබ්බානසුත්ත, 1972.
13. බු.ජ.මු. පිටුව 242.
14. ම.නි., (1), අලගද්දූපමසුත්ත, 1972 බු.ජ.මු. පිටුව 324.
15. ම.නි., (1), මහා තණ්හාසඞ්ඛයසුත්ත, 1972 බු.ජ.මු. පිටුව 602.
16. ම.නි., (2), භද්දාලියසුත්ත, බු.ජ.මු. පිටුව 175.